(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(4).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2025 ජනවාරි 06 සඳුදා

---

## 2025 ජනවාරි 21 අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

134/2024

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර ගිවිසුම අත්සන් කරන ලද දිනය කවරේද;

(ii) එම ගිවිසුමේ ඇති කොන්දේසි හේතුවෙන් ජනතාව විශාල පීඩනයකට ලක් වී තිබෙන බව දන්නේද;

(iii) ඉහත ගිවිසුම සංශෝධනය කර යම් සහනයක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

148/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ඉදිකර ඇති කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය විවෘත කරන ලද දිනය කවරේද;

(ii) එම ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් එම ක්‍රීඩා සංකීර්ණය පරිහානියට පත් වී ඇති බව දන්නේද;

(iv) එම ක්‍රීඩා සංකීර්ණයේ ඇති මීටර් 400 ධාවන පථය නිසි ප්‍රමිතියට සකස් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(v) එම ක්‍රීඩා සංකීර්ණයේ ආරක්ෂිත තාප්පයෙන් පිටත ඇති, එයට අයත් භූමිය රථවාහන නතර කිරීම සඳහා සුදුසු වන පරිදි සකස් කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩා සංකීර්ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ඇති කර ගෙන ඇති ගිවිසුම පිළිබඳව දන්නේද;

(ii) එම ක්‍රීඩා සංකීර්ණයේ ඇති ක්‍රීඩාංගනය, ක්‍රිකට් ක්‍රීඩා කිරීම සඳහා සුදුසු වන පරිදි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ එක්ව සංවර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

175/2024

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන රජය සතු සමාගම්, සංස්ථා සහ අනෙකුත් වාණිජ ආයතන සංඛ්‍යාව;

(ii) පසුගිය වසර 15 තුළ මෙම ආයතන විසින් ජනනය කරන ලද මුළු ලාභය/ අලාභය සහ ආයෝජන මත ප්‍රතිලාභය;

(iii) මෙම ආයතනවල වාණිජ මෙහෙයුම් ආරම්භයේ සිට මේ දක්වා සමුච්චිත හෝ ඒකරාශි වූ ලාභ/අලාභ;

(iv) කෙටි කාලීන සහ දිගු කාලීන පදනමින් මෙම ආයතනවල ආයෝජනය කර ඇති ප්‍රාග්ධනයේ සහ ණයවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

240/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජයේ ඇතැම් ප්‍රධාන රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන් සඳහා End Post නමින් නව තනතුරු නිර්මාණය කර ඇති බව දන්නේද;

(ii) එම තනතුරු නිර්මාණය කිරීම සිදු කරනු ලබන විද්‍යාත්මක පදනම කවරේද;

(iii) නොඑසේ නම්, සමහර නිලධාරීන්ගේ අභිමතය පරිදි අභිමත අවස්ථාවලදී පමණක් එම තනතුරු නිර්මාණය කරන්නේද;

(iv) ඒ සඳහා විධිමත්, විනිවිදභාවයෙන් යුත් සහ පුද්ගල අභිමතයන්ට අනුව හැසිරවිය නොහැකි ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

244/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා නාගරික සංවර්ධන සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කවරේද;

(iii) එම සැලසුම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

253/2024

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් ග්‍රාම නිලධාරි වසම් අනුව වෙන් වෙන් වශයෙන් හෙක්ටයාර්වලින් කොපමණද;

(iii) එම ඉඩම්වලින් දෙවැනි පාර්ශ්වයන් වෙත ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iv) එම එක් එක් දෙවැනි පාර්ශ්වයේ නම, එම පාර්ශ්වයට ඉඩම් ලබා දී ඇති ස්ථානය සහ ලබා දී ඇති පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් නොවන, රජයේ ඉඩම් පිහිටි ස්ථාන හා ප්‍රමාණයන් හෙක්ටයාර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මේ වනවිට හඳුනාගෙන ඇති කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) එම ඉඩම් අතරින් මේ වනවිට වගා කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

259/2024

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2022 සිට 2024 දක්වා කාලය තුළ දී හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහභාගි වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය කරන ලද රට, අරමුණ, ශ්‍රී ලංකාවට හිමි වූ ප්‍රතිලාභ, හිටපු ජනාධිපතිවරයාට අමතරව රජයේ වියදමින් සම්බන්ධ වූ පුද්ගලයන් සහ ඔවුන් සම්බන්ධ කර ගැනීමේ අරමුණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විදේශ සංචාර සඳහා වැය කරන ලද සම්පූර්ණ වියදම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

316/2024

ගරු දේවානන්ද සුරවීර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෙත්සම්කාර මුතුතන්ත්‍රිගේ නිලංක දිල්ශාන් කුරේ සහ තවත් පෙත්සම්කරුවන් හතර දෙනෙකු විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ අංක SC FR 55/2019 සහ 2019 පෙබරවාරි 13 දිනැති නඩුව එකී පාර්ශ්වකරුවන් ඉදිරියේ සමථයකට පත් වී ඇති බව දන්නේද;

(ii) එකී සමථය ප්‍රකාරව, 1 වැනි පෙත්සම්කරු ආයුර්වේද ශාස්ත්‍රීය පාඨමාලාව හැදෑරීම සඳහා 2019 වර්ෂයේ දී ඇතුළත් කර ගෙන තිබේද;

(iii) අංක 2 සිට 5 දක්වා වූ පෙත්සම්කරුවන් ඔවුන්ගේ විභාග කටයුතු පවත්වා අවසන් කර තිබේද;

(iv) ආයුර්වේද ශාස්ත්‍රීය පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් මේ වනවිට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

318/2024

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රා.ප.ච. 03/2016හි වැටුප් පරිමාණයන් 2020.01.01 සිට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීමත් සමඟම 2016.01.01 සිට 2019.12.31 දක්වා වූ කාලය තුළ විශ්‍රාම ගැන්වූ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප ඒ අනුව සංශෝධනය කරන ලද බවත්;

(ii) 2019.11.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රා.ප.ච. 35/2019 නිකුත් කර ඇති බවත්;

(iii) එය තාවකාලිකව අත්හිටුවීමට 2020.01.02 අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බවත්;

(iv) ඒ හේතුවෙන්, 2016.01.01 සිට 2019.12.31 දක්වා විශ්‍රාම ගැන්වූ විශ්‍රාමිකයන්ට 2020.01.01 සිට ලැබිය යුතුව තිබූ විශ්‍රාම වැටුප අහිමි වීමෙන් අගතියට පත් වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2020.01.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කර 2019.11.11 දිනැති තීරණය බලාත්මක කිරීමට පියවර ගන්නේද;

(ii) 2020.01.01 සිට ලැබිය යුතු විශ්‍රාම වැටුප 2025 වර්ෂයේ සිට ගෙවීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා 2025 වර්ෂයේදී වෙන්කළ යුතු මුදල කොපමණද;

(iv) ඉහත (අ)(iv) අනුව අගතියට පත් වූ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අතරින් මිය ගොස් ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

321/2024

ගරු අජිත් ගිහාන් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය කාලයේදී, සීමාසහිත හලාවත වැවිලි සමාගම සතු ඉඩම්වල වැලි කපා අලෙවි කරනු ලැබූ බව දන්නේද;

(ii) එසේ නම්, එම වැලි අලෙවි කිරීමේ අරමුණු කවරේද;

(iii) පාරිසරික වශයෙන්ද අහිතකර මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගමේ පොල් වතුවලින් උපයන වාර්ෂික ආදායම කොපමණද;

(ii) ඉහත සමාගම සතු පොල්වතු ඉන්දියාවේ අමුල් සමාගමට ලබා දීමට පසුගිය රජයන් විසින් කටයුතු කරමින් සිටි බව දන්නේද;

(iii) එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ඉහත සමාගමේ පොල් වතුවල පොල් ඵලදාව අඩුවීමට හේතු කවරේද;

(v) එම පොල්වතුවල පොල් ඵලදාව ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2025 ජනවාරි 21 අඟහරුවාදා)**

283/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට පවතින වැසි සහිත අයහපත් කාලගුණය හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ හඳුනාගෙන ඇති නායයෑම් අවදානම සහිත ප්‍රදේශ/ස්ථාන කවරේද;

(ii) එම ප්‍රදේශ/ස්ථාන අතරින් ජනාවාස සහ පොදු දේපළ පිහිටි ස්ථාන කවරේද;

(iii) මේ වනවිටත් ජනතාව පදිංචිව සිටින අවදානම් සහිත නිවාස හා නිශ්චල දේපළ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිවාසවල පදිංචිකරුවන් සඳහා ඉදිරිපත් කරනු ලබන විකල්ප යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

284/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට පවතින වැසි සහිත අයහපත් කාලගුණය හේතුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ හඳුනාගෙන ඇති නායයෑම් අවදානම සහිත ප්‍රදේශ/ස්ථාන කවරේද;

(ii) එම ප්‍රදේශ/ස්ථාන අතරින් ජනාවාස සහ පොදු දේපළ පිහිටි ස්ථාන කවරේද;

(iii) මේ වනවිටත් ජනතාව පදිංචිව සිටින අවදානම් සහිත නිවාස හා නිශ්චල දේපළ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිවාසවල පදිංචිකරුවන් සඳහා ඉදිරිපත් කරනු ලබන විකල්ප යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

285/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට පවතින වැසි සහිත අයහපත් කාලගුණය හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ හඳුනාගෙන ඇති නායයෑම් අවදානම සහිත ප්‍රදේශ/ස්ථාන කවරේද;

(ii) එම ප්‍රදේශ/ස්ථාන අතරින් ජනාවාස සහ පොදු දේපළ පිහිටි ස්ථාන කවරේද;

(iii) මේ වනවිටත් ජනතාව පදිංචිව සිටින අවදානම් සහිත නිවාස හා නිශ්චල දේපළ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිවාසවල පදිංචිකරුවන් සඳහා ඉදිරිපත් කරනු ලබන විකල්ප යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද ?

286/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට පවතින වැසි සහිත අයහපත් කාලගුණය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ හඳුනාගෙන ඇති නායයෑම් අවදානම සහිත ප්‍රදේශ/ස්ථාන කවරේද;

(ii) එම ප්‍රදේශ/ස්ථාන අතරින් ජනාවාස සහ පොදු දේපළ පිහිටි ස්ථාන කවරේද;

(iii) මේ වනවිටත් ජනතාව පදිංචිව සිටින අවදානම් සහිත නිවාස හා නිශ්චල දේපළ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිවාසවල පදිංචිකරුවන් සඳහා ඉදිරිපත් කරනු ලබන විකල්ප යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

287/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට පවතින වැසි සහිත අයහපත් කාලගුණය හේතුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ හඳුනාගෙන ඇති නායයෑම් අවදානම සහිත ප්‍රදේශ/ස්ථාන කවරේද;

(ii) එම ප්‍රදේශ/ස්ථාන අතරින් ජනාවාස සහ පොදු දේපළ පිහිටි ස්ථාන කවරේද;

(iii) මේ වනවිටත් ජනතාව පදිංචිව සිටින අවදානම් සහිත නිවාස හා නිශ්චල දේපළ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිවාසවල පදිංචිකරුවන් සඳහා ඉදිරිපත් කරනු ලබන විකල්ප යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

288/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට පවතින වැසි සහිත අයහපත් කාලගුණය හේතුවෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඳුනාගෙන ඇති නායයෑම් අවදානම සහිත ප්‍රදේශ/ස්ථාන කවරේද;

(ii) එම ප්‍රදේශ/ස්ථාන අතරින් ජනාවාස සහ පොදු දේපළ පිහිටි ස්ථාන කවරේද;

(iii) මේ වනවිටත් ජනතාව පදිංචිව සිටින අවදානම් සහිත නිවාස හා නිශ්චල දේපළ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිවාසවල පදිංචිකරුවන් සඳහා ඉදිරිපත් කරනු ලබන විකල්ප යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2025 ජනවාරි 22 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/2024

ගරු හේෂා විතානගේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය තුළ වන අලි රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා මේ වනතෙක් වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ලද මූලාශ්‍ර කවරේද;

(iv) මේ වනවිට එම ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බවට චෝදනා එල්ල වී ඇති බව දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

61/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකන් ගුවන් සේවය ලැබූ ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් කාලසීමාවේදී ශ්‍රී ලංකන් ගුවන් සේවය ලාභ/අලාභ ලැබීමට හේතු කවරේද;

(iii) ශ්‍රී ලංකන් ගුවන් සේවය අලාභ නොලබන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

68/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය යහපාලන රජය සමයේ මඩකලපුව මන්මුනෙයි-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වවුනතීවුහි නිවාස ඒකක 50කට අධික සංඛ්‍යාවකින් සමන්විත නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකරන ලද බවත්;

(ii) එහි ඇති සමහර නිවාසවල ඉදිකිරීම් අවසන් කර ඇතත් සමහර නිවාසවල ඉදිකිරීම් මේ දක්වා අවසන් කර නොමැති බවත්;

(iii) ඉන් පසුව බලයට පැමිණි රජයන් විසින් එම නිවාස නැවත ප්‍රතිසංස්කරණය කර ජනතාවට ලබා නොදුන් බවත්;

(iv) ඒ අනුව, වර්ෂ 8කට වඩා අධික කාලයක සිට එම ප්‍රදේශයේ ජනතාව ඒ හේතුවෙන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත නිවාස යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නිම කරනු ලබන කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

81/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(ii) එම කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේ අරමුණ කවරේද;

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් මේ වනවිට විවිධ පුද්ගලයන්/ආයතන විසින් වංචනික ආකාරයෙන් අත්පත් කරගෙන තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම කොමිෂන් සභාව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

89/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ගංගා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගංගාවල නම් කවරේද;

(iii) එම ගංගා බොහෝමයක් දූෂණයට ලක් වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, එම ගංගා පවිත්‍ර කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) ගංගා දූෂණය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

319/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.01.01 සිට 2024.12.20 දක්වා කින්නියා විදුලි පාරිභෝගික මධ්‍යස්ථාන බලප්‍රදේශය තුළ විදුලි සැපයුම විසන්ධි කරන ලද පැය සංඛ්‍යාව එක් එක් ප්‍රදේශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත විසන්ධි කිරීම් හේතුවෙන් අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනය හදාරන සිසුන්, රැකියා කරන්නන් ඇතුළු එම ප්‍රදේශවල මහජනතාව දැඩි ලෙස පීඩාවට පත් වූ බව පිළිගන්නේද;

(iii) මෙම බලප්‍රදේශයේ විදුලි සැපයුම විසන්ධි කිරීම් නිරතුරුවම සිදු වන බව දන්නේද;

(iv) එසේ නම්, එයට හේතු කවරේද;

(v) ඒ සඳහා විසඳුම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුද්‍රිත විදුලි බිල්පත වෙනුවට කෙටි පණිවිඩ මාර්ගයෙන් මාසික විදුලි බිල නිකුත් කිරීමේ ක්‍රමවේදයක් තිබෙන බව පිළිගන්නේද;

(ii) ඒ හේතුවෙන් ස්මාට් ජංගම දුරකථන නොමැති මෙන්ම වයෝවෘද්ධ විදුලි පාරිභෝගිකයන් දැඩි අපහසුතාවයකට ලක් වන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ වෙනුවට පෙර පරිදි මුද්‍රිත බිල්පතක් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

320/2024

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කල්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, 1989 දී උප දිසාපති කොට්ඨාසයක් ලෙස ස්ථාපිත කර, පසුව 1993.03.17 දිනැති අංක 93/600/034 හා 1993.03.31 දිනැති අංක 93/600/034(I) යන අමාත්‍ය මණ්ඩල සංදේශ සහ 1993.07.09 දිනැති අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ වාර්තාව ද පදනම් කර ගෙන 1993.09.28 දිනැති අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය සහිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද බවත්;

(ii) ඒ අනුව, එය ස්වාධීන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ලෙස වර්ෂ 34කට වැඩි කාලයක් ක්‍රියාත්මක වන බවත්;

(iii) කල්මුණේ-උතුර (දෙමළ කොට්ඨාසය) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, කල්මුණේ-දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප කාර්යාලයක් ලෙස පහත හෙළීමට උත්සාහ කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(iii)හි සඳහන් පහත හෙළීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, එම පහත හෙළීමේ පදනම කවරේද;

(iv) අමාත්‍ය මණ්ඩල තීරණයක් අභිබවා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්, උප කාර්යාලයක් ලෙස පහත හෙළීමට අමාත්‍යාංශ ලේකම්වරයෙකුට/රජයේ නිලධාරියෙකුට හැකියාවක් තිබේද;

(v) එසේ නම්, එහි නීත්‍යානුකූලභාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

323/2024

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිසියේ, පොලිස් අශ්වාරෝහක කොට්ඨාසයක් තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට එම කොට්ඨාසයේ සිටින අශ්වයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව වයස් කාණ්ඩ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් අශ්වාරෝහක කොට්ඨාසයට ජීව අශ්වයන් 15දෙනෙකු ආනයනය කිරීම සඳහා LA/SJ/300/2024 දරන අංකය යටතේ ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ ටෙන්ඩර් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අශ්වයන් ආනයනය කිරීම සඳහා තෝරා ගන්නා ලද සැපයුම්කරු කවුරුන්ද;

(iv) ඉහත සඳහන් ටෙන්ඩරය අනුව එම අශ්වයින් 15දෙනා ආනයනය කිරීම සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

324/2024

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව අපනයනය කරනු ලබන නිමි තේ සඳහා සෙස් බද්දක් අය කරනු ලබන බව දන්නේද;

(ii) මේ වනවිට තේ කිලෝ ග්‍රෑම් එකක් සඳහා අය කරනු ලබන සෙස් බද්ද කොපමණද;

(iii) 2024 වර්ෂයේදී එම සෙස් බද්ද මඟින් උපයන ලද ආදායම කොපමණද;

(iv) එම ආදායමෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ තේ පර්යේෂණ ආයතනය යන ආයතන වෙත ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් එම මුදල් වියදම් කර ඇති ආකාරය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

327/2024

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පැවති කඩුවෙල, කොතලාවල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ‘පට හා සේද කර්මාන්ත ශාලාවක්’ තිබූ ඉඩමෙන් සී/ස ධර්මායතන ආරක්ෂණ සභාවට සහ වෙනත් පාර්ශ්ව වෙත ඉඩම් කොටස් නිදහස් කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිදහස් කරන ලද ඉඩම් කොටස් හැර ඉතිරි ඉඩම් ප්‍රමාණයෙන් නේවාසික කටයුතු සඳහා අන්සතු කර ඇති ඉඩම් කොටස් සංඛ්‍යාව;

(ii) මාර්ග හා රක්ෂිත සඳහා වෙන් කර ඇති ඉඩම් කොටස් සංඛ්‍යාව;

(iii) පොදු කටයුතු සඳහා වෙන් කර ඇති කොටස් සංඛ්‍යාව;

(iv) එම එක් එක් කොටසේ විශාලත්වය ඉඩම් මිනුම් ඒකක වර්ග ප්‍රමාණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ)හි සඳහන් ඉඩම්, අන්සතු කර ඇති පදනම සහ කාල වකවානුව කවරේද;

(ii) එම අවස්ථාවේදී පර්වසයක වටිනාකම සහ වර්තමාන වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (ආ)(ii)හි සඳහන් ඉඩම් කොටස් සලකුණු කර ඇති ඉඩම් සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(iv) පොදු කටයුතු සඳහා ඇති ඉඩම් කොටස් වර්තමානයේ භාවිත කරනු ලබන අරමුණු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 ජනවාරි 23 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

103/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 ඔක්තෝබර් 21 දින සිට නොවැම්බර් 30 දින දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල් ලීටර් ප්‍රමාණය සහ බොරතෙල් බැරල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ඉන්ධන වර්ගයක ලීටරයක් සඳහා රජය විසින් අය කරන ලද බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජය විසින් අය කර ගෙන ඇති සම්පූර්ණ බදු මුදල ඉහත සඳහන් එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ගොඩබෑමේ ගාස්තු ලෙස ඉහත සඳහන් ඉන්ධන තොගවලට ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

111/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපනයන සැකසුම් කලාපයක ප්‍රමාණවත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඉතා වැදගත් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම ඇතුළුව එම අපනයන සැකසුම් කලාපය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

149/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර නගරය, මිල්ලනිය, වාද්දුව, මොරොන්තුඩුව වැනි අධික ජනගහනයකින් යුතු සහ විවිධ කර්මාන්ත පිහිටුවා ඇති සහ සංචාරක කර්මාන්තයට ඉතා වැදගත් ප්‍රදේශයකට, දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් ප්‍රවේශය සපයන, "පැල්පොල අන්තර් හුවමාරුව" ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතියක් බව පිළිගන්නේද;

(ii) එම ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දී ඇති මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(v) ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට වැය කර ඇති මුදල කොපමණද;

(vi) එම ව්‍යාපෘතිය නිම කිරීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(vii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

(viii) ගැලනිගම අන්තර් හුවමාරුවේ සිට දොඩන්ගොඩ අන්තර් හුවමාරුව දක්වා ඇති දුර කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

176/2024

ගරු රවි කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා බැංකුව සංස්ථාගත කළ දිනය;

(ii) වර්තමාන සභාපතිවරයාගේ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ නම්;

(iii) ශාඛා සහ සේවක සංඛ්‍යාව;

(iv) අද වන විට කොටස් නිකුතු ප්‍රාග්ධනය;

(v) එය ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ බාසල් (BASEL) නියමයට අනුකූල වන්නේද;

(vi) අනුකූල නොවන්නේනම්, ඒවා විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර 10 සඳහා ලාභය සහ ඉදිරි වසර 3 සඳහා අපේක්ෂිත ලාභය;

(ii) ඉහත (i) අනුව පසුගිය වසර 10 සඳහා ආයෝජනය මත ප්‍රතිලාභ;

(iii) පසුගිය වසර 5 සඳහා පරිපාලන පිරිවැය සහ ආන්තික ණය අනුපාතිකය;

(iv) පරිපාලන පිරිවැය ණය අනුපාතිකයේ ප්‍රතිශතයක් ලෙස;

(v) 2019 සිට මේ දක්වා ශේෂ පත්‍ර අගයන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රුපියල් බිලියනකට වඩා වැඩි ණය මුදල් කපා හැර තිබේද;

(ii) ඊට අදාළ ආයතනවල නම්;

(iii) ණය කපා හැරීම් සඳහා අනුගමනය කර ඇති නෛතික කාර්යපටිපාටි කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

241/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) “පවුල් වෛද්‍ය” (Family Medicine) නමින් විශේෂඥ පුහුණු ක්ෂේත්‍රයක් ඇති කිරීමේ අපේක්ෂාව කවරේද;

(ii) මේ වනවිට එම විශේෂඥ වෛද්‍යවරුන් ඉහත අපේක්ෂාව ඉටු වන ආකාරයට, එනම් පොදු සමාජයට සහ ප්‍රාථමික වෛද්‍ය සේවාවට ආසන්න වන ලෙස ඒ සඳහා අනුයුක්ත කර තිබේද;

(iii) නොඑසේ නම්, යම් යම් පෞද්ගලික අවශ්‍යතාවයන් මත නගරාසන්න රෝහල්වලට අනුයුක්ත කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

250/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ —

(i) රසායනාගාර පරීක්ෂණවලින් තහවුරු කරන ලද කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව;

(ii) තහවුරු කරන ලද කොවිඩ්-19 මරණ සංඛ්‍යාව;

(iii) එම මරණ සංඛ්‍යාව වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පදිංචි පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 —

(i) මෘත ශරීර බැහැර කිරීම සඳහා යොදාගත් ක්‍රමවේද/ක්‍රමවේදය කවරේද;

(ii) ආදාහනය කිරීමෙන් බැහැර කරන ලද මෘත ශරීර සංඛ්‍යාව කොපමණද;

(iii) භූමදානය කිරීමෙන් බැහැර කරන ලද මෘත ශරීර සංඛ්‍යාව කොපමණද;

(iv) වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව ආදාහනය කරන ලද සහ භූමදානය කරන ලද මෘත ශරීර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

254/2024

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් ඉදිරිපත් කර තිබූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කරන්නේද;

(ii) එමගින් යෝජනා කර තිබූ සෞන්දර්ය, තොරතුරු තාක්ෂණය සහ ගිණුම්කරණය වැනි විෂයයන් ඉවත් කිරීම අනුමත කරන්නේද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන ක්‍රමයේ වෙනසක් කිරීමට අදහස් කරන්නේද;

(iv) නව අධ්‍යාපන යෝජනා මගින් සිසුන් මුහුණ දෙන පීඩනය අවම කරන ආකාරය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සෑම රජයේ පාසලකටම සම්පත් සමානව බෙදා දීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

(ii) අධ්‍යාපනයේ ඇති දැඩි තරඟකාරීත්වය අඩු කිරීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

(iii) විශ්වවිද්‍යාල අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සිදු කරනු ලබන සැලසුම් කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

260/2024

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ වියදම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉලක්කයට ළඟා වී නොමැති බව 2024.11.23 වන දින පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ, ශ්‍රී ලංකා කාර්යාලයේ ප්‍රධානී පීටර් බෲවර් මහතා විසින් ප්‍රකාශ කර ඇති බව දන්නේද;

(ii) 2024 වර්ෂය සඳහා වූ අයවැය ප්‍රකාශය මඟින් අස්වැසුම, වැඩිහිටියන්, නිදන්ගත රෝග සහිත පුද්ගලයන් හා ආබාධිත පුරවැසියන් සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(iii) 2024.11.23 දින වනවිට එම මුදලෙන් වියදම් කර ඇති මුදල කොපමණද;

(iv) එය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සමාජ වියදම් (Social Spending) සඳහා ලබා දෙන ඉලක්කයට අනුව 2024 වර්ෂයේදී සමාජ වියදම් සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(vi) ඒ සඳහා ප්‍රමාණවත් පරිදි එම මුදල් වෙන් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

295/2024

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දසවැනි පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා ලබා දී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන ලබා දී ඇති පදනම කවරේද;

(iii) එම වාහන ජනාධිපති කාර්යාලය මඟින් ලබා දී තිබේද;

(iv) නොඑසේ නම්, ලබා දී ඇති ආයතන කවරේද;

(v) එම වාහන සඳහා රජයේ රියදුරන් ලබා දී තිබේද;

(vi) එම වාහන සඳහා ඉන්ධන, නඩත්තු වියදම් සහ වාර සේවා සපයනු ලබන ආයතන කවරේද;

(vii) එම වාහන සඳහා මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

317/2024

ගරු දේවානන්ද සුරවීර මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ-11, ඕල්කට් මාවතේ ව්‍යාපාර කරමින් සිටි ව්‍යාපාරිකයන් පිරිසක් සිය ව්‍යාපාරික ස්ථානවලින් ඉවත් කර “පාවෙන වෙළෙඳපොළ” නමැති ස්ථානයෙන් ඔවුන්ට වෙළෙඳසැල් ලබා දී තිබේද;

(ii) ප්‍රමාණවත් වෙළෙඳාමක් නොමැති වීම හේතුවෙන් එම වෙළෙඳසැල් මේ වනවිට අසාර්ථක වී ඇති බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් ඉහත සඳහන් ව්‍යාපාරිකයන් ඔවුන් පෙර ව්‍යාපාර සිදු කරන ලද ස්ථාන නැවත ඉල්ලා සිටින බව දන්නේද;

(iv) එසේ නම්, පෙර ව්‍යාපාර සිදු කරන ලද ස්ථාන නැවත ඔවුන්ට ලබා දීමට හැකියාවක් තිබේද;

(v) “පාවෙන වෙළෙඳපොළ” වැඩිදියුණු කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජනවාරි 24 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2024

ගරු හේෂා විතානගේ මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරු දින ප්‍රහාරයට පෙර මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම කඩා දැමීමේ සිද්ධිය වාර්තා වූ දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ ආරක්ෂක නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යෑමේදී එම ආරක්ෂක නිලධාරීන්ට බලපෑම් එල්ල කරනු ලැබූ එවකට ආණ්ඩුකාරවරු සහ ආණ්ඩුවේ ප්‍රබල පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සිද්ධියට අදාළ පරීක්ෂණවල වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

62/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 වැනි දින සිට මේ දක්වා සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර ලබාදීම සඳහා අය කරනු ලබන ගාස්තුව කොපමණද;

(iii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් වෙනුවෙන් කඩිනමින් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

70/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්-පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කලුවන්කේනි-2 ප්‍රදේශයේ, සී-නෝර් නිවාස යෝජනා ක්‍රමය නමින් නිවාස යෝජනා ක්‍රමයක් 1982 වර්ෂයේදී ඉදිකරන ලද බව දන්නේද;

(ii) එම නිවාස/ඉඩම් සඳහා හිමිකම් ඔප්පු මේ දක්වා ලබා දී නොමැති වීම හේතුවෙන් එම නිවාස/ඉඩම්වලට විදුලිය සහ පානීය ජල පහසුකම් ලබා ගැනීමේදී ඒවායේ පදිංචිකරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බව දන්නේද;

(iii) එසේ නම්, එම නිවාස/ඉඩම්වලට හිමිකම් ඔප්පු ලබා දීමට පියවර ගන්නේද;

(iv) එම ඔප්පු ලබා දෙන කාල වකවානු කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

82/2024

ගරු රෝහණ බංඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය සතුව මේ වනවිට ඇති ගුවන්යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනය විසින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන ගුවන් ගමනාන්තයන් කවරේද;

(iii) මේ වනවිට ඉහත ආයතනයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත ආයතනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

90/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම සහල් ආනයනය කරන ලද රටවල් කවරේද;

(iv) එම සහල් ආනයනය කරන ලද ආයතන කවරේද;

(v) සහල් ආනයනය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

105/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේදී පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගයට අදාළ ප්‍රශ්න පත්‍ර හෝ එම ප්‍රශ්න පත්‍රවල අන්තර්ගත ප්‍රශ්න, ඉහත විභාගය පැවැත්වූ දිනට පෙර බාහිර පාර්ශ්වයන් වෙත ලැබී තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) ඒ හේතුවෙන් අගතියට පත් වූ සිසුන් වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද;

(v) එම විභාගයේ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම අත්හිටුවා තිබේද;

(vi) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

112/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(ii) මේ වනවිට එම කලාපය සඳහා ලැබී ඇති ආයෝජන සංඛ්‍යාව හා ඒවායේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආයෝජන තුළින් මේ වනවිට උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අපනයන කලාපය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

245/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර පාලනය කිරීම සඳහා යෝජිත ව්‍යාපෘති අතරින් මේ දක්වා ක්‍රියාත්මක නොකර ඉතිරිව ඇති ව්‍යාපෘති කවරේද;

(ii) ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාල වකවානුව, අරමුදල් සපයා ගනු ලබන ආකාරය සහ ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

296/2024

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් සභා පාසල්වලින් ජාතික පාසල් සඳහා රජයේ ගුරුවරුන් අනුයුක්ත කර ඇති බව දන්නේද;

(ii) එම ගුරුවරුන් අනුයුක්ත කර ඇති කාල සීමාව නැවත දීර්ඝ නොකිරීමට තීරණය කර තිබේද;

(iii) එම කාල සීමාව දීර්ඝ නොකිරීම හේතුවෙන් ජාතික පාසල්වල ඇති වන ගුරු පුරප්පාඩු තුලනය කරනු ලබන ආකාරය කෙසේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

322/2024

ගරු අජිත් ගිහාන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් ඉතාලියේ රැකියා කරනු ලබන අතර ඔවුන්ගේ රියදුරු බලපත්‍ර අලුත් කර ගැනීමට නොහැකි වීම ප්‍රධාන ගැටලුවක් වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) විදේශීය රැකියාවල නිරත වී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් අමානුෂික වද හිංසාවලට භාජනය වන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(v) විදේශ රැකියා ලබා දෙන බවට පොරොන්දු වී මුදල් වංචා කර සිටින ආයතන/ පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(vi) වංචා කර ඇති මුදල් නැවත ලබා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?